# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/05 – 2022 ඔක්තෝබර් 17 වැනි සඳුදා – 2022.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/112.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.22 දිනැති හා අංක 2115/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, පමුණුව, පොල්වත්ත පාර, අංක 172හි පදිංචි අයි.ජී.ආර්.එස්. ගුණරත්න මයා සහ කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 45හි පිහිටි මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37805 – 11 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

අයි.ජී.ආර්.එස්. ගුණරත්න මයා,
අංක 172, පොල්වත්ත පාර,
පමුණුව,
මහරගම.

නඩු අංකය : A/29/2019. *පළමුවැනි පාර්ශ්වය.*
IR/COM/02/2018/112.

*සහ,*

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක : 45,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල.

ප්‍රදානය

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.03.14 වැනි දින මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් IR/COM/02/2018/112 යටතේ 2019.03.06 වැනි දින ගොණු කරන ලද ලේඛනය අනුව

ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ

"විනය චෝදනාවකට අදාළව පැවැති මූලික විමර්ශනයෙන් නිවැරදිකරු වී ඇති අයි.ජී.ආර්.එස්.ගුණරත්න මහතාට නැවත සේවයේ පිහිටුවීමේදී මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වවුනියාවේ පිහිටුවීමට යෝජිතව තිබූ උතුරු පළාතේ ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කිරීමෙන් අයි.ජී.ආර්.එස්.ගුණරත්න මහතාට අසාධාරණයක් සිදු ව තිබේද? අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ." යන්නයි.

දෙපාර්ශ්වය විසින් විස්තර ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට හැකියාවක් ඇද්දැයි සලකා බැලීම සඳහා 2020.08.28 වැනි දින කැඳවන ලදී. එදින ඉල්ලුම්කරු ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ මෛත්‍රී පිටවල මහතා සමඟ නීතිඥ ශෂික හෙට්ටිආරච්චි මහතා ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් නියෝජනය කරමින් සහකාර මානව සම්පත් කළමණාකාරිය ප්‍රදීපිකා ලක්මාලි මහත්මිය ද පෙනී සිටි අතර එම පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ නාමල් රාජමුණි මහතා සමඟ නීතිඥ ජනප්‍රිත් ප්‍රනාන්දු මහතා පෙනී සිටියහ.

මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කර ගත හැකිදැයි සලකා බැලීම සඳහා දිනයක් ලබා දෙන ලද අතර ඒ සඳහා 2021.03.09 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරු තමාට සිදු වී ඇති අසාධාරණය පිළිබඳ අමාත්‍යවරයාට අභියාචනයක් ඉදිරිපත් කළ බවත් ඉල්ලුම්කරු වහාම හිඟ වැටුප් හා දීමනා සහිතව යළි සේවයේ පිහිටුවන ලෙස අමාත්‍යවරයා මිල්කෝ සමාගමේ සභාපති වෙත 2021.02.12 වැනි දින ලිපියක් මගින් දැනුම් දී ඇති බවයි. ඒ පිළිබඳ කරුණු දක්වමින් 2

වන පාර්ශ්වය සඳහන් කළේ ඒ සම්බන්ධයෙන් සාමනායාධිකාරීවරයා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති බවයි. ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු ඒ බව දැනුම් දෙන බවයි. කෙසේ වුවද 2021.04.20 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ අදාළ ආරාවුල පිළිබඳව සමථයක් ඇති කර ගත හැකියාවක් නොමැති නිසා විමසීමට නියම කරන ලෙසය. ඒ අනුව 2021.05.07 දා තමින් ඉල්ලුම්කරුගේ සාක්ෂිය A1 සිට A 22 දක්වා වූ ලේඛන සමඟ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරන ලද අතර 2022.03.10 වැනි දින ඉල්ලුම්කරු සාක්ෂි ලබා දෙන ලදි. එදින සාක්ෂි අවසන් වීමෙන් පසු ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ දෙවන පාර්ශ්ව සමාගමට නව කළමණාකාරිත්වයක් පත් වී ඇති හෙයින් මෙම ගැටළුව බේරුම් කර ගැනීම සඳහා උත්සාහයක් දරන බවය.

වැඩිදුර විමසීම සඳහා මෙම නඩුව 2022.07.26 වැනි දින කැඳ වූ අවස්ථාවේදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරු පසු වැටුප් රහිතව ඔහු සේවය කරන ලද ශ්‍රේණියේ පිහිටුවා රැකියාව ලබා දීමටත්, වාර්ෂික වැටුප් වර්ධක ලබා දීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇති බවය. ඉල්ලුම්කාර පාර්ශ්වය ඊට කැමැත්තක් දක්වන්නේ නම් මෙම ආරාවුල විසඳා ගත හැකි බවය. එම සමථ යෝජනා පිළිගන්නා බව පළමු පාර්ශ්වය සඳහන් කළ අතර පසු වැටුප් ලබා දීම සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදී.

සමථය පිළිබඳ වැඩිදුරටත් සලකා බැලීම සඳහා 2022.08.23 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය අනුව වර්ෂ 2005.10.01 දින සිට අඛණ්ඩව සේවා කාලයට යටත්ව 2022.09.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන කාර්යාලයට අයත්, කිරි පට්ටි සංවර්ධන හා කිරි සැපයුම් අංශයට අනුයුක්ත කරමින් සහ සහකාර කළමණාකාර තනතුරට සේවයේ පිහිටු වීමට එකඟ වන බවත්, ඊට අමතරව වර්ෂ 2011 සිට වර්ෂ 2021 දක්වා නියමිත වාර්ෂික වැටුප් වර්ධක මූලික වැටුපට එකතු කොට රුපියල් 28,500ග00ක වැටුප් තලයක පිහිටු වීමටද අවසන් වරට උපයාගත් වැටුප් පදනම් කරගනිමින් 2019.05.29 වැනි දින සිට 2022.08.31 දක්වා රුපියල් 1,217,589.64 හිඟ වැටුපක් ගෙවීමටද එකඟ වන බවයි. එසේම නැවත සේවයේ පිහිටුවීමට අදාළව දෙවන පාර්ශ්වය සමාගමේ සභාපති අත්සන් තබන ලද වර්ෂ 2022.08.19 දින දරන මුල් පිටපත ඉල්ලුම්කරුට බාර දෙන ලදී.

ඉල්ලුම්කාර පාර්ශ්වය ඉහතින් සඳහන් කරන ලද කරුණුවලට එකඟව මෙම කරුණ සමථයකට පත් කර ගැනීමට ඉල්ලුම්කාර පාර්ශ්වය එකඟතාවය පල කිරීමෙන් පසු විමසීම අවසන් කරන ලදී. ඒ අනුව වවුනියාවේ පිහිටි යෝජිත උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් වූ බව දෙවන පාර්ශ්වය පිළිගෙන ඉහතින් සඳහන් කරන ලද සහන ලබා දීමට කටයුතු කිරීම හා එම සහන පිළිගැනීමට ඉල්ලුම්කරු එකඟ වීම නිසා එම සහන ඉල්ලුම්කරු වෙත ප්‍රදානය කරමි. එම මුදල ගැසට්ගත කිරීමෙන් මසක් ඇතුලත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත තැන්පත් කිරීමට නියෝග කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත බවද ප්‍රකාශ කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින දීය.

EOG 10-0153